දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary: 2784812
කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ........................................

මගේ අංකය / எமது இல. / My No. පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව ED/01/12/01/04/24

දිනය / திகதி / Date 2005.05.11

චක්‍රලේඛ අංක: 2005/17

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම විදුහල්පතිවරුන් වෙත

## පාසල තුළ විනය ආරක්ෂා කිරීම

අනාගත පුරවැසියන් බිහිකරන පාසල එහි ඉගෙන ගන්නා සිසුන්ට දැනුම හා කුසලතා ලබාදෙන අතර ම, සමාජයේ විනය ගරුක ව ජීවත් වීමට අවශ්‍ය වන ආකල්ප හා සාරධර්ම ප්‍රගුණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගද ගත යුතු වේ.

වර්තමාන සමාජයේ දක්නට ලැබෙන අයහපත් ප්‍රවනතාවක් නම් ළමයා හිංසනයට හා අපයෝජනයට ලක්විමේ සිද්ධීන් වැඩි වීමය. වර්තමාන සංකීර්ණ සමාජ රටාව තුළ පාසල් වියේ පසුවන ළමයින් පාසල තුළදී ද විවිධාකාර පුද්ගලයන්ගේ හිංසනයන්ට භාජන වෙමින් පවතින බව ඉදිරිපත් වන වාර්තාවලින් පැහැදිලි වේ. එවැනි එක් සිද්ධියක් නිසාවෙන් වුවද ළමයෙකුගේ මුළු ජීවිතයම අඳුරුවීමට ඉඩ තිබේ. මෙම හිංසනයන් සිදුකරන පුද්ගලයන් හා ආයතනයන් අතරට පාසල් පද්ධතිය, එහි සිටින කාර්ය මණ්ඩලය හා සිසුන් ද අන්තර් ගත වන බව අනාවරණය වී ඇත.

පාසල් සිසුන්ට විවිධ ආකාරයෙන් සිදු කරනු ලබන හිංසනයන් සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්ට ගුරුවරුන්ට හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට විරුද්ධව දෙමාපියන් නීතිමය තත්ත්වයන්ට යොමු වූ අවස්ථා රාශියකි. තව ද ලෝකයේ ළමා හිංසනය වැඩිවීමත් සමගම ළමා රැකවරණ කටයුතු හා ළමා අයිතීන් සුරැකීමේ විවිධ පියවර පුළුල් වෙමින් පවතී. එබැවින් පාසල තුළ දී මෙන් ම ඉන් පිටත දී මෙවැනි අවස්ථාවන්ට ළමයින් භාජනවීමට ඉඩ නොතැබිය යුතු අතර, යම් හෙයින් එවැනි අවස්ථාවක් පැනනැගුණු විට සිය ආරක්ෂාව සඳහා ගතයුතු පියවර පිළිබඳව ද ළමයින් දැනුවත් කළ යුතු ය. පාසල තුළ සිසුන්ට ආරක්ෂාව සැලසීම හා හිංසන වැළැක්වීම අත්‍යාවශ්‍ය බැවින් මෙමගින් ලබාදෙන උපදෙස් පිළිපැදිය යුතු බව අවධාරණය කරමි.

## 2.00 ශාරීරික දඬුවම්

සෑම අවස්ථාවක දී ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශාරීරික දඬුවම් දීමෙන් වැළකිය යුතු ය. විදුහල්පතිවරුන්, ගුරුවරුන් විසින් සිසුවා තුළ චර්යාමය වෙනසක් ඇති කිරීමේ චේතනාවෙන්, සද්භාවයෙන් වුව ද ශාරීරික දඬුවම් කිරීම නොකළ යුතු ය. මෙහි දී දඬුවම් දීමෙන් නොව, කරුණු අවබෝධ කරදීම, ආදර්ශය හා මනා සංවිධානය මගින් අභ්‍යන්තර වශයෙන් ස්වයං විනයක් ඇතිකර ගැනීමට පුහුණු කිරීමෙන්, කෙනෙකු සිය ජීවිතය පුරාම නිතීගරුක පුද්ගලයකු වශයෙන් ජීවත්වීමට අවශ්‍ය පුහුණුව ලබාගන්නා බව අමතක නොකළ යුතු ය.

ශ්‍රී ලංකාව විසින් ද අත්සන් කර, ස්ථිරකර ඇති (1989) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 28(2) වගන්තිය මගින් ද පාසල් විනය පරිපාලනය ළමයාගේ මානව ගරුත්වයට අනුකූල වන ආකාරයට සිදු කරන බවට වගබලා ගත යුතු බව අවධාරණය කර ඇත.

2.1 ශාරීරික දඬුවම් සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනයන්ගෙන් හෙළි වී ඇත්තේ ළමුන් තුළ විනය ගොඩ ගැස්වීමේ දී දෙන ලද දඬුවම්වලින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබී ඇති බවත් පහත සඳහන් අහිතකර තත්වයන් මතුවීමට ඉඩකඩ ඇති බවත් ය.

- I. ශාරීරික දඬුවම් භාවිත කිරීම තුළින් හොරකම් කිරීම, පහරදීම වැනි සමාජ විරෝධී චර්යා රටා සිසුන් තුළ මතුවීම
- II. ළමා අපහරණයට ඇති අවදානම වැඩිවීම
- III. සිසුන් තුළ ආක්‍රමණශිලි චර්යා රටා ඇතිවීම
- IV. ශිෂ්‍යයා හා ගුරුවරයා/ විදුහල්පතිවරයා අතර සම්බන්ධතා ක්‍රමයෙන් විනාශ වී යාම
- V. නිශේධාත්මක සමාජ හා මානසික කැළඹීම් තත්වයකට ළමයා පත්වීම
- VI. ළමයා විසින් සංකල්ප ගොඩනැගීමේ දී අහිතකර ආකාරයෙන් බලපෑම් ඇති වීම

තව ද ශාරීරික දඬුවම් දීමෙන් තොරව විනය පවත්වාගෙන යා නොහැකි නම් එමගින් පිළිබිඹු කරන්නේ ගුරුවරයාගේ අදක්ෂ භාවය බව පැහැදිලි වේ.

2.2 ශාරීරික දඬුවම් වෙනුවට පහත සඳහන් විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකි ය.

- I. පාසලේ සිටින සිසුන් විනය විරෝධී ක්‍රියාවන්හි යෙදීමට ඇති ඉඩකඩ අවම කිරීම පිණිස පාසලේ ක්‍රියාකාරිත්වය හා විෂය සමගාමී කටයුතු මනාව සංවිධානය කර තිබීම.
- II. පාසලේ විනය නීති පද්ධතිය පිළිබඳව සියලු දෙනාව ම දැනුවත් කිරීම හා යහපත් ක්‍රියා ප්‍රතිපෝෂණය කිරීම කළ යුතු අතර වැරදි ක්‍රියාවලට අනුබල නොදීම හෝ අනුමත නොකිරීම.
- III. මනා හැසිරීම් රටාවක් ඇති කිරීමටත් පාසල තුළ විනය පවත්වා ගෙන යාමටත් විනයානුකූල හැසිරීමේ වැදගත්කම අවබෝධකරදීම, ආදර්ශමත්වීම හා සිසුන්ට නිසි මාර්ගෝපදේශනය ලබාදීම.
- IV. ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් වරදක් කළ අවස්ථාවක දී ඔහු/ ඇය විසින් කරන ලද වරද අවබෝධ කරදීම.
- V. තදබල විනය විරෝධී කටයුතු සිදුකළ අවස්ථාවන්හි දී ද, ශාරීරික දඬුවම් දීම වෙනුවට අවවාද කිරීම හා/හෝ දෙමාපියන්ට/ භාරකරුවන්ට දැනුම්දීම.
- VI. වරද කළ ශිෂ්‍යයා/ ශිෂ්‍යයාව භුක්ති විඳින වරප්‍රසාද සීමා කිරීම හෝ අත්හිටුවම. උදාහරණයක් ලෙස පංති නායක, ශිෂ්‍ය නායකභාවය අහෝසි කිරීම් වැනි ක්‍රියාමාර්ගයක් ගත හැකි ය.
- VII. බරපතල විනය විරෝධී ක්‍රියාවක් සිදුකළවිට දෙමාපියන්ට දන්වා සති 02කට නොවැඩිකාලයක් පංති තහනම් කිරීම.

ඉහත VI හා VII යටතේ ක්‍රියාකිරීමේ දී විදුහල්පතිවරයා විසින් පාසල් විනය මණ්ඩලය කැඳවා එමගින් සිදුකරනු ලබන නිසි පරීක්ෂණයකින් පසුව ගනු ලබන තීරණයක් මත පමණක් එසේ ක්‍රියා කළ යුතු ය.

VIII. පාසලේ විනය මණ්ඩලය විසින් ඉතා බරපතල විනය විරෝධී ක්‍රියාවක් සිදුකර ඇති බව තීරණය කරනු ලබූ අවස්ථාවක දී එම ක්‍රියාවේ ස්වභාවය හා බරපතලකම අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ඇති ව සති 02කට වැඩි කාලයක් පංති තහනම් කිරීම හෝ ළමයා වෙනත් පාසලක ඉගෙනුම ලබමින් සිටි ශ්‍රේණියට ම මාරු කිරීම.

සිසුන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමේදී ඒ පිළිබඳ වාර්තා ලේඛනගත කළයුතු අතර ඒවා පරීක්ෂාකාරීව විදුහලේ තබා ගැනීමට කටයුතු කළ යුතු යි.

තවද VII හා VIII හි සඳහන් ක්‍රියාමාර්ග ගැනීමේදී විදුහල්පති විසින් ඒ පිළිබඳ ලොග් සටහනක් ද තැබිය යුතු යි. ඉහත සඳහන් පරිදි සිසුන්ගේ මනා හැසිරීම් රටාව ඇති කරලීමේ අරමුණින් ගනු ලබන ක්‍රියා මාර්ග විදුහලේ ප්‍රධාන රැස්වීම හෝ දැන්වීම් පුවරු ආදිය මගින් පාසල තුළ ප්‍රසිද්ධ නොකිරීමට වග බලාගත යුතුයි.

2.3 පාසල් විනය පවත්වාගෙන යාමේ අරමුණින් වුව ද සිසුන්ට දඬුවම් දීම සිදුකළ හොත් පහත සඳහන් නීති ක්‍රියාමාර්ගවලට මුහුණදීමට සිදුවනු ඇත.

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iii වන පරිච්ඡේදයේ 11 වන වගන්තිය හා xvi වන පරිච්ඡේදයේ 126 වැනි වගන්තිය අනුව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ නඩු නිමිත්තක් උද්ගත විය හැකි ය.

II. 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහයේ (සංශෝධන) පනතේ 3 වන වගන්තියේ හා ප්‍රධාන ප්‍රඥප්තියේ 308 (අ) වගන්තිය යටතේ ළමයින් කෲරත්වයට භාජනය කිරීමේ වරද යටතේ නඩු නිමිත්තක් උද්ගත විය හැකි ය.

III. අධ්‍යාපන අමාත්‍යාංශයේ බලධරයන් විසින් පවත්වනු ලබන විනය පරීක්ෂණවලින් ශාරීරික දඬුවම් ලබාදී ඇති බව ඔප්පු වුවහොත් ආයතන සංග්‍රහයේ 11 වන කාණ්ඩය අනුව විනය ක්‍රියාමාර්ග ගනු ලැබිය හැකි ය.

## 3.00 ළමා අපහරණය

3.1 ළමා වියට නොගැළපෙන විවිධ නොනිසි ක්‍රියා සඳහා ළමයින් යොදවා ගැනීම ළමා අපහරණය ලෙස සරල ව හැඳින්විය හැකි ය. ශ්‍රී ලංකාව තුළ වසර ගණනක සිට ළමා අපහරණ සිද්ධීන් ඉතා සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර වර්තමානයේ විවිධ ආකාරයේ ළමා අපහරණ සිද්ධීන් රාශියක් දිනපතා වාර්තා වන තත්ත්වයකට පත්ව ඇත.

පාසල තුළ ද ළමා අපහරණ සිදුවීම් වාර්තාවීම ඉතා ම කණගාටුදායක තත්වයකි. පාසලේ දී ළමයාගේ සුරක්ෂිතභාවය සහතික කළයුතු විදුහල්පති, ගුරු හා අනෙකුත් කාර්යමණ්ඩල තුළින් ළමයාට අකටයුතුකම් සිදුවීම වඩාත්ම ඛේදනීය තත්ත්වයකි.

3.2 ළමා අපහරණ අතරින් ලිංගික අපහරණයට සිසු/ සිසුවියන් යොදවා ගැනීම ඉතා බරපතල වරදකි. ශ්‍රී ලංකාවේ 80 දශකයේ මැද භාගයේ ළමා හා කායික අපයෝජනය වරදක් බවත් 90 දශකයේ මුල් භාගයේ දී ළමා ලිංගික අපයෝජනය බරපතල වරදක් බවත් හඳුනාගෙන ඇත.

එම නිසා පාසල තුළ ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් කිසියම් වූ අපයෝජනයකට ලක්වීම වළක්වා ගැනීම විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ වගකීම වේ.

පාසල තුළ ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ට ලිංගික හෝ වෙනත් අපයෝජනයක් සිදුකර ඇත්නම් එය සත්‍ය බව ඔප්පු වුවහොත් බරපතල දඬුවම්වලට ලක්විය හැකි බව විශේෂයෙන් අවධාරණය කරමි.

3.3 පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ද ඇතුළු ව පාසල තුළ සිදුකරනු ලබන සියලු කාර්යයන්වලට බාධා සිදුවන අයුරින් විදුහලේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් විසින් විනය විරෝධී ක්‍රියාවකට සිසුන් පෙළඹවීම කිසිසේත් නොකළ යුතු ය. සිසුන් විනය විරෝධී ක්‍රියාවනට පෙළඹවීමක් එවැනි පිරිස් වෙතින් කර ඇති බවට චෝදනා ඉදිරිපත් ව ඇතිවිටක එම චෝදනා ඔප්පු වුවහොත් සිසුන් පෙළඹවීම සම්බන්ධයෙන් අදාළ කණ්ඩායම් හෝ පුද්ගලයකු වෙත දැඩි දඬුවම් ලබා දිය හැකි ය.

මෙසේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ දී ඉහත 2.3, I, II හා III හි සඳහන් පරිදි ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ඇති බව වැඩිදුරටත් සඳහන් කරමි.

**4.00** ළමා හිංසනය සම්බන්ධයෙන් සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම ඇතුළු විශේෂ බලතල රාශියක් සහිත ව 1998 අංක 50 දරණ පාර්ලිමේන්තු පනත මගින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා ඇත. එම අධිකාරිය මගින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ හෝ පාසල් ප්‍රධානීන්ගෙන් කිසියම් සහායක් ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක දී ඒ සඳහා අවශ්‍ය උපරිම සහයෝගය එම අධිකාරිය වෙත ලබා දෙන ලෙස ද මෙමගින් උපදෙස් දෙමි.

තව ද අමානුෂික අන්දමින් කායික හෝ මානසික දඬුවම් ලබාදීමෙන් තොර ව පාසල තුළ විනය පවත්වාගෙන යාමේ වැදගත්කම අවධාරණය කරන අතර පාසල තුළ ළමා අපයෝජන ක්‍රියා සිදුනොවන වාතාවරණයක් ඇති කර ගැනීමටත් වගබලා ගත යුතු බව වැඩිදුරටත් අවධාරණය කරමි. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා විදුහල්පතිවරුන් හා ගුරු මහත්ම/ මහත්මීන් කටයුතු කිරීම උදක්ම අපේක්ෂා කරමි.

පාඨශාලා ශිෂ්‍යයන්ට ශාරීරික දඬුවම් දීම පිළිබඳ අංක 1961/26 හා 1961.07.21 දිනැති චක්‍රලේඛය හා පාසල තුළ විනය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක 2001/11 හා 2001.03.30 දිනැති චක්‍රලේඛය මෙයින් අවලංගු වන බව මෙයින් දන්වා සිටිමි.

වෛද්‍ය ටාරා ද මැල්
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :
1. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම ශාඛා ප්‍රධානීන්
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්
4. විභාග කොමසාරිස් ජනරාල්
5. ජාතික අධ්‍යාපන කොමිසමේ සභාපති